www.kidworship.kr

# පළමු සභාව

-The First Church-



152Page

**පොතේ ගුරා** යේසුස්වහන්සේ කුරුසිපත් වී දින 3කින් පසුව නැවත නැඟිට, දින 40කට පසුව නැවත ස්වර්ගයට ගිය සේක. එවිට ගෝලයන් උඩුමහල් මැඳුරේ එකට රැස්වී එකතුව යාච්ඤා කරනවා. මරියාතුමිය සහ යේසුස්වහන්සේ පසුපස ගිය අනෙකුත් කාන්තාවන්ද මේ අයට එකතු වී සිටි අතර ඔවුන් ඉතා ඕනෑකමින් යාච්ඤා කළා. දින 10කට පසුව පෙන්තකොස්ත දිනය පැමිණියා.



153Page

**පොතේ ගුරා** ඒ දවසේදී උන්වහන්සේගේ ගෝලයන් සහ අනුගාමිකයන් යාච්ඤා කරන පිණිස උඩුමහල් මැඳුරේ රැස්වී සිටියා. එකපාරටම තද සුළඟක් හමන්නාක් මෙන් ශබ්දයක් අහසෙන් පැමිණ, ඔවුන් සිටි මුළු ගෙය පිරී ගියා. ගිනි වැනි දිව් බෙදී ගොස් එකිනෙකා මත පිහිටනවා ඔවුන් දැක්කා. යේසුස්වහන්සේ පොරොන්දු වූ ශුද්ධාත්මයාණන්වහන්සේ ගෙන් ඔවුන් පිරුණා. ගෝලයන් සහ අනුගාමිකයන් ශුද්ධාත්මයාණන්වහන්සේ පුළුවන්කම දුන් ප්‍රකාරයට එක එක භාෂාවලින් කතා කරන්න පටන් ගත්තා.

**1 භාෂාව** අරිගත්තෝගෝෂයිම්මාෂිහිටා...

**2 භාෂාව** යේ ෂේ ෂේ...

**3 භාෂාව** Dear heavenly father, Thank you…

**පොතේ ගුරා** මේවා අසා සිටි අය පුදුමෙන් පුදුමව කතා කළා.

**1 මිනිසා** මේ ඔක්කොම මිනිස්සු ගලීලයෝ නේද? මේ හැමදෙනාම වෙන වෙන භාෂාවන් දන්නේ කොහොමද ?

**2 මිනිසා** එයාලා වයින් වැඩියෙන් බීලා වෙන්නැති...



154Page

**පොතේ ගුරා** පේදුරු විසින් ජනතාවට දෙවියන්වහන්සේගේ වචනය දේශනා කරන්න පටන් ගත්තා.

**පේදුරු** යේසුස්වහන්සේ නැවත නැඟිට ස්වර්ගයට ගියායින් පසුව, යේසුස්වහන්සේ අපට ඉගැන්වූ දේවල් තේරුම්ගන්න පිණිස උදව්කරන්න ශුද්ධාත්මයාණන්වහන්සේ පැමිණියා. දෙවියන්වහන්සේ යේසුස්වහන්සේව මේ ලෝකයට එවුවේ, ඔයාලව ගළවන්න.

**පොතේ ගුරා** පේදුරු කතා කරනවා අසා සිටි අය නැවත පේදුරුගෙන් ප්‍රශ්ණ කළා.

**සෙනඟ 1** එසේ නම් අපි ගැළවෙන පිණිස කුමක් කරමුද?

**පේදුරු** පසුතැවිලිව, යේසුස්වහන්සේගේ නාමයෙන් පව්කමාව ලබා, බෞතීස්මය ලබන්න.

**සෙනඟ 2** ඒ විතරක්ද? අපි පසුතැවිලි වෙලා, බෞතීස්මය ලැබුවොත් අපිත් ගැළවෙනවා...

**පේදුරු** ඔව් ! එහෙම තමයි.



155Page

**පොතේ ගුරා** පේදුරු කියූ දේවලට සවන් දීගෙන සිටි අය දේව ගරු බියෙන් ඇළලී ගියා. ඒ පණිවිඩය පිළිගත් අය බෞතීස්මය ලැබුවා. සෙනගට **3000**ක් දෙනා එකතු කරනු ලැබුවා. ඉන් පසු අපෝස්තුළුවරුන් දේව වචනය ඉගැන්වීම නොනවත්වාම කරනු ලැබුවා. එසේ කළ සැමවිටම සෙනග පසුතැවිලිවෙමින් විශ්වාස කරන්න පටන් ගත්තා.

**පොතේ ගුරා** දෙවියන්වහන්සේට යාච්ඤාවන් සහ ප්‍රශංසාවන් කරන පිණිස යේසුස්වහන්සේගේ අපෝස්තුළුවරුන් සහ ඇදහිලිවන්තයන් නොකඩවාම දේවමාළිගාවේදී එකතු වුණා. ඔවුන් ඔවුන්ට ඇති දේපල විකුණමින් අවශ්‍යතා ඇති අය අතරේ බෙදා දුන්නා. ඔවුන් ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් පිරීමෙන් පසුව යේසුස්වහන්සේගේ ඉගැන්වීමේද, සහභාගීකමේද, රොටී කැඩීමේදී එක්සිත්ව සිටියා. මේවා දුටු අය දේව ගරු බියෙන් ඇළලී ගියා. ඔවුන් දෙවියන්වහන්සේට නමස්කාර ප්‍රශංසා කරන ගමන් අපෝස්තුළුවරන්ටද ස්තුති කළා. දෙවියන්වහන්සේද සැමදාම ඔවුන්ගේ ගණනට ගැළවෙන්නාවූ අය එකතු කළා. මේ තමයි පළමු සභාව.



156Page



157Page

**ජීවිතයට අදාල කිරීම** දුවේ පුතේ, අපේ සභාව ආරම්භ වුණ ආකාරය හරි පුදුමයි නේද? අපිත් ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලය ලබන්න ආසා වෙමු. අපිටත් ඒ ආත්මය දෙන්න දෙවියන්වහන්සේ කැමතියි. ඒ බලයෙන් පුංචි අපිත් යාච්ඤා කරමු. අන් අයව සභාවට ගෙනෙමු. සභාවේ සේවය කරමු.